# මාසික

# විවරණිකාව

2011 සැප්තැම්බර්



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

61 වැනි වෙළුම 09 වැනි කලාපය

## 2011 සැප්තැම්බර්

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශයः ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

# පටුන


*පිටුව*

1 වන කොටස - පුවත්පත් නිවේදන - 2011 සැප්තැම්බර් ..... 05

1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 සැප්තැම්බර් ..... 05
2. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම පිළිබඳව වූ පුවත්පත් නිවේදනය ..... 06
3. මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත ..... 07
4. 2011 ජූලි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය ..... 09
5. 2011 ජූලි මාසයේ දී ගෙවුම් තුලනයේ ඉහළ අතිරික්තයක් වාර්තා කළේය ..... 12
6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද ..... 14

# 1 වන කොටස
# පුවත්පත් නිවේදන
# 2011 සැප්තැම්බර්

## 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 සැප්තැම්බර්

*විදේශීය සහ දේශීය ඉල්ලුම ඉහළයාම හේතුකොටගෙන දේශීය ආර්ථික කටයුතු තවදුරටත් ප්‍රශංසනීය වේගයකින් වර්ධනය වෙමින් පවතී. කර්මාන්ත සහ සේවා යන දෙඅංශයෙන්ම සතුටුදායක වර්ධනයක් වාර්තාවීමත් සමග ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2011 ප්‍රථම භාගයේ දී සියයට 8 කින් පමණ වර්ධනය වූ බව ඇස්තමේන්තු කෙරේ. මේ අතර, කෘෂිකාර්මික අංශයේ දායකත්වය ද ප්‍රථම කාර්තුවේ දී පැවති පහළ බැසීමට සාපේක්ෂව දෙවන කාර්තුවේ දී ධන අගයක් ගන්නා ලදී. දේශීය ආර්ථික කටයුතු පිළිබඳව පවතින හිතකර පෙර දැක්ම, ඉදිරියේ දී දේශීය මිල ගණන් කෙරෙහි ද හිතකර ලෙස බලපානු ඇත.*

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි වෙළෙඳ භාණ්ඩවල මිල ගණන් තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණ ද, දේශීය සැපයුම් තත්ත්වයන් වැඩිදියුණුවීම සහ ශ්‍රී ලංකා රුපියලෙහි අගය ස්ථායීවීම, දේශීය උද්ධමනය පාලනය කිරීමට උපකාරී විය. 2011 අගෝස්තු මාසයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකයට (2006/07= 100) අනුව ගණනය කරනු ලබන මතුපිට උද්ධමනය මෙන්ම මූලික උද්ධමනය ද අඩු විය. 2011 අගෝස්තු මාසයේ දී මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පෙර මාසයේ දී වූ සියයට 7.5 සිට සියයට 7.0 දක්වා අඩු වූ අතර මූලික උද්ධමනය ජූලි මාසයේ දී සියයට 8.9 සිට අගෝස්තු මාසයේ දී සියයට 7.8 දක්වා අඩු විය. මේ අතර වාර්ෂික සාමාන්‍ය පදනම මත මතුපිට උද්ධමනය 2011 ජූලි මාසයේ දී පැවති සියයට 7.0 සිට අගෝස්තු මාසයේ දී සියයට 7.1 දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර මූලික උද්ධමනය 2011 ජූලි මාසයේ දී සියයට 7.4 ක සිට අගෝස්තු මාසයේ දී සියයට 7.5 දක්වා ඉහළ ගියේය.

අපනයන සහ ආනයන අඛණ්ඩවම ශීඝ්‍ර ලෙස වර්ධනය විය. වෙළෙඳ ගිණුමේ හිඟය ඉහළ ගිය ද සේවා ගිණුමට වූ ලැබීම් මෙන්ම අඛණ්ඩව ඉහළ ගිය සේවක ප්‍රේෂණ වර්තන ගිණුමේ හිඟය සමනය කිරීමට උපකාරී වූ අතර එය විදේශීය අංශයෙහි ස්ථායීතාව පවත්වා ගැනීමට උපකාරී විය. මේ අතර, ආර්ථිකයෙහි විවිධ අංශයන්හි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතීන් හේතුකොට ගෙන ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම වෙත ද විදේශ මුදල් ලැබෙමින් පවතී. තවද, මෑතක දී නිකුත් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කරය මඟින් ලබාගත් අරමුදල් මහ බැංකුව මිල දී ගැනීමත් සමඟ දළ නිල සංචිත තවදුරටත් ඉහළගිය අතර මෙතෙක් වාර්තාගත ඉහළම මට්ටමක පවතී.

මුදල් අංශයෙහි වර්ධනයක් සලකා බැලීමේ දී, පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2011 ජූලි මාසයේ දී සියයට 20.7 ක ඉහළ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, දේශීය ආර්ථික කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් පෞද්ගලික අංශය විසින් ලබාගත් ණය ප්‍රමාණය ඉහළයාම, මෙම වර්ධනයට හේතු විය. දියුණු ආර්ථිකයන්හි මෙන්ම නැඟී එන ආර්ථිකයන්හි ආර්ථික කටයුතුවල මන්දගාමී වීමක් ඇතිවීමත් සමඟම ලෝක ආර්ථික කටයුතු ද යම් දුරකට මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය ඉදිරි කාලයේදී ණය වර්ධනය හා එමඟින් මුදල් සැපයුමෙහි වර්ධනය සීමා කිරීම සඳහා බලපෑමක් ඇති කරනු ඇත. කෙසේ වුවද ඉදිරි කාලයේදී මුදල් සැපයුමෙහි වර්ධනය සීමාකිරීම සඳහා අවශ්‍ය වුවහොත් සුදුසු

මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් අනුගමනය කරනු ඇත.

ඉහත සාකච්ඡා කරන ලද කරුණු ද ඇතුළත්ව, මෑත කාලයේ දී සිදු වූ සාර්ව ආර්ථික වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, මුදල් මණ්ඩලය විසින් 2011 සැප්තැම්බර් මස 15 වැනි දින පැවති රැස්වීමේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. මේ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.00 ක් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 ක් ලෙස පවත්වාගෙන යනු ඇත.

මීළඟ මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2011 ඔක්තෝබර් මස 10 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

## 2. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම පිළිබඳව වූ පුවත්පත් නිවේදනය

*2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ පනතට අදාළව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් 2011 සැප්තැම්බර් 21 දින ඉදිරිපත් කරන ලද සංශෝධන පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.*

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට පවත්නා වූ නීති තව දුරටත් ශක්තිමත් කිරීම මෙම සංශෝධනවල අරමුණ විය. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිණිස වූ ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය, මූල්‍ය කාර්ය සාධන බලකාය විසින් සම්මත කරගන්නා ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ නිර්දේශ 40 ක් සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ විශේෂ නිර්දේශ 09 ක් මත පදනම් වේ. මූල්‍ය කාර්ය සාධන බලකාය, යනු මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට අදාළව ගෝලීය ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා G7 කණ්ඩායම විසින් ස්ථාපිත කරන ලද අන්තර් රාජ්‍යය ආයතනයකි. ඉහත සංශෝධන මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සඳහා වූ ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට පූර්ණ අනුකූලතාවය දක්වයි.

මෙම සංශෝධන මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ නීති පද්ධතිය තවදුරටත් ශක්තිමත් කරන අතරම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, නීතිය බලාත්මක කරන ආයතන විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවලට පහසුකම් සැපයීමද සිදුකෙරේ.

**2005 අංක 25 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත**

- ශ්‍රී ලාංකික පුරවැසියන් සහ ශ්‍රී ලංකාව තුළ දී ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන පුද්ගලයන් ඇතුළත් වන පරිදි ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ නීතිය පුළුල් කිරීම.
- "අරමුදල" යන්න නිර්වචනයේ දී ශ්‍රී ලංකාව තුළ හෝ පිටත තබා ගනු ලබන, ස්ථාවර හා චංචල වත්කම් මෙන්ම ස්පර්ශ හා අස්පෘශ්‍යිය වත්කම් ඇතුළත් කිරීම.
- "ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ වරද" යන්නට එක් ත්‍රස්තවාදියෙකු සඳහා මුදල් සැපයීම

සහ/හෝ ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවකට අරමුදල් සැපයීම ඇතුළත් කිරීම.

- ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සම්බන්ධ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සම්බන්ධ, අරමුදල් සහ දේපළ, අධිචෝදනා ගොනු කිරීමට ප්‍රථම, අත්හිටුවීමේ බලය පොලීසිය වෙත ලබා දීම.

**2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත**

- ශ්‍රී ලංකාව තුළ දී මුදල් විශුද්ධිකරණ වරදක් සිදු කිරීම සම්බන්ධව, ඕනෑම පුද්ගලයකු ඇතුළත් වන පරිදි නීතිය වෙනස් කිරීම.
- මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය තුළින් ඉපැයූ දේපළ බැහැර කර ඇති අවස්ථාවේ දී, ඒ හා සමාන වෙනත් දේපළක් හරහා වටිනාකම අයකර ගැනීමේ හැකියාව සැලැස්වීම.
- පවත්නා අනෙකුත් නීති යටතේ අවුරුදු 7 ඉක්මවා සිර දඬුවම් ලැබිය හැකි වැරදි මුදල් විශුද්ධිකරණය යටතේ වැරදි ලෙස සළකන ලදී. නව සංශෝධන මගින් වසර 7 වසර 5 දක්වා අඩු කිරීම තුළින් මුදල් විශුද්ධිකරණය යටතේ ගැනෙන වැරදි සංඛ්‍යාව පුළුල් කිරීම.
- අනීතික ක්‍රියා යන්නට විදේශයක් තුළ කරන ලද පූර්ව නිශ්චිත වැරදි ඇතුළත් කිරීම.

## 3. මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත

*යෝජිත මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත 2011.09.21 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී. මෙම නව පනත මගින් දැනට මුදල් ව්‍යාපාර සඳහා බලාත්මක නීතිය වන 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත අවලංගු කර ඒ වෙනුවට නව පනත ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත.*

මීට වසර 20 කට පමණ පෙර බලාත්මක වූ මුදල් සමාගම් පනත වර්තමාන තත්ත්වයන්ට උචිත වන පරිදි වෙනස් කිරීමේ අවශ්‍යතාවය මූල්‍ය අංශයට මෙන්ම නියාමකයන්ට ද හැඟී ගොස් තිබිණ. බලපත්‍රලාභී මුදල් සමාගම්වලට අදාළව විමර්ශනය කිරීමේ හා පාලනය කිරීමේ බලය පුළුල් කිරීම සහ අනවසරයෙන් තැන්පතු රැස්කරන පුද්ගලයන් හා ආයතන ඵලදායී ලෙස මැඩලීම සඳහා නීති ප්‍රතිපාදන වැඩි කිරීමේ අවශ්‍යතාවයන් පැවතිණි. තවද, බලාත්මක වෙමින් පවතින පනත සංශෝධනය කිරීමට වඩා නව පනතක් පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය ද වැඩි වෙනු ඇත. එබැවින්, මුදල් ව්‍යාපාර පනත නමින් නව නීතියක් ගෙන ඒමට තීරණය කරන ලදී.

ඵලදායී ලෙස මුදල් ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා අංග කිහිපයක්ම නව පනතෙහි හඳුන්වා දී ඇත. තැන්පතු රැස්කිරීම මුදල් ව්‍යාපාරයක අවශ්‍යම අංගයක් වන අතර "තැන්පතු" යන්න අර්ථ දැක්වීමේ ඇති අපැහැදිලි බව නිසා අනවසරයෙන් මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම, වරදක් ලෙස ඔප්පුකිරීමේ දී ගැටලු පැන නැගී ඇත. එම නිසා, නව පනතෙහි "තැන්පතු" යන්න අර්ථ දක්වා ඇති අතර අනවසරයෙන් තැන්පතු රැස්කිරීම වරදක් ලෙස සැලකේ.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ අනවසරයෙන් තැන්පතු රැස්කරන ආයතන සම්බන්ධයෙන් ඵලදායී හා කාලීන ක්‍රියාමාර්ග

ගැනීම සඳහා, එම ආයතන විමර්ශනය හා සෝදිසි කිරීමේ බලතල වැඩි කර ඇත.

අනවසර තැන්පතු රැස්කරන ව්‍යාපාර මැඩලීම සඳහා නව පනතෙහි ප්‍රතිපාදන කිහිපයක්ම හඳුන්වා දී ඇත. අනවසරයෙන් තැන්පතු රැස්කිරීම සඳහා ප්‍රචාරණය කිරීම හා අනවසරයෙන් තැන්පතු රැස්කිරීම සඳහා දැන්වීම් පළකිරීම වරදක් ලෙස අර්ථ දක්වා ඇති අතර අනවසරයෙන් තැන්පතු රැස්කරන ආයතනවල තොරතුරු හා පොත් සැපයීමට පුද්ගලයකුට බලකිරීම සඳහා උසාවි නියෝගයක් ලබාගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන හඳුන්වා දීම ඉන් කිහිපයකි.

නව පනත මගින්, සමාගමක් එය හඳුන්වන නාමය අනුව බලපත්‍රලාභී මුදල් සමාගමක් ද යන්න මහජනතාවට පහසුවෙන් හඳුනා ගැනීම සඳහා ප්‍රතිපාදන සපයා ඇති අතර සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින්ම "මුදල්", "මූල්‍යකරණ" හෝ "මූල්‍ය" යන වචනවලින් එකක් හෝ භාවිතා කළ යුතු අතර මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව වෙනත් කිසිදු ආයතනයකට මෙම නම් භාවිතා කිරීම තහනම් කර ඇත. තවද, බලපත්‍රලාභී මුදල් සමාගම් හැඳින්වෙන නම්, ඒවායේ ලුහුඬු නම්වලට සමාන නම් හෝ මුදල් සමාගම් හැඳින්වෙන නමෙහි වචනවල මුලකුරු එක්කර සෑදූ නම් භාවිතා කරමින් මහජනතාව නොමග යැවීම හා ව්‍යාජ ලෙස පෙනී සිටීම වලකාලීම සඳහා, වෙනත් කිසිඳු සමාගමක් විසින් මුදල් සමාගමක නම, ලුහුඬු නම හෝ මුදල් සමාගමේ නාමයේ වචනවල මුලකුරු එක්කර සෑදූ නම් භාවිතා කිරීම තහනම් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත.

බලපත්‍රලාභී මුදල්සමාගම්සම්බන්ධයෙන් වූ අධීක්ෂණ කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ පාලකයකු මුදල් සමාගම තුළ හෝ ඊට සම්බන්ධ කටයුතුවල නිරතවීම වලකාලීම, මුදල් සමාගම් ප්‍රතිසංවිධානය කිරීම, එහි ප්‍රාග්ධනය වැඩි කිරීමට කටයුතු යෙදීම හා/හෝ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීම යන බලතල ද ඇතුළත්ව මුදල් මණ්ඩලයට නව බලතල ලබා දී ඇත. තවද, අධ්‍යක්ෂවරුන්ගේ හා කළමනාකරුවන්ගේ යෝග්‍යතාව හා යහපාලනය තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාර තනතුරු දරන පුද්ගලයන්ගේ නුසුදුසුකම් සඳහන් කර ඇත.

මහජනතාවට ආයෝජන තීරණ ගැනීම පහසු කිරීමට හා අනවසරයෙන් තැන්පතු රැස් කරන ව්‍යාපාර පිළිබඳ දැනුවත්භාවය පුළුල් කිරීම සඳහා, අධීක්ෂණ ඇගයීමක් ඇතුළත් කරමින් මුදල් සමාගම්වල නම් ප්‍රකාශයට පත් කිරීමටත්, යම් සමාගමක් සම්බන්ධයෙන් අධීක්ෂණ ගැටලු ඇත්නම් ඒ බව සඳහන් කරමින් එම සමාගමේ නම ප්‍රකාශයට පත්කිරීමට හා අනවසරයෙන් මුදල් ව්‍යාපාර පවත්වාගෙන යන හෝ තැන්පතු රැස්කරන බවට මුදල් මණ්ඩලය මගින් තීරණය කළ පුද්ගලයන්ගේ හා ආයතනවල නම් හා ලිපිනයන් ප්‍රකාශයට පත්කිරීමටත්, මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

නව පනත යටතේ දඬුවම් වැඩි කර ඇති අතර වරදකට සහාය වීම හා වරදට පෙළඹවීම වරදක් ලෙස සැලකේ. තවද, අවසරයකින් තොරව මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම හා අවසරයකින් තොරව තැන්පතු රැස්කිරීම, නීතිපතිතුමා විසින් ඉහළ උසාවියක දී අධිචෝදනා ගොනු කළ හැකි වැරදි වේ. මෙම ප්‍රතිපාදන මගින් වඩාත් ඵලදායී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා නීතියට එරෙහිව කටයුතු කරන්නන් වලකාලීමට උපකාරී වනු ඇත.

## 4. 2011 ජූලි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

*පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී 2011 ජූලි මාසයේ දී අපනයන ආදායම සහ ආනයන වියදම තවදුරටත් වර්ධනය විය. 2011 ජූලි මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 958 ක් දක්වා ළඟා විය. 2010 ජූලි මාසයේ පැවැති ඉහළ පදනම් අගය පිළිබිඹු කරමින්, 2011 ජූලි මාසයේ දී අපනයන ආදායම සියයට 9.4 කින් වර්ධනය වූ අතර, ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,777 දක්වා සියයට 58.2 කින් වර්ධනය විය.*

ඒ අනුව 2011 පළමු මාස හත තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පිළිවෙලින් එ.ජ.ඩොලර් 6,014 ක් දක්වා සියයට 30.3 කින් ද, එ.ජ.ඩෙලර් මිලියන 11,091 ක් දක්වා සියයට 48.3 කින් ද වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙළෙඳ හිගය එ.ජ.ඩොලර් මිලියන 5,077 ක් දක්වා පුළුල් විය.

ජූලි මාසයේ අපනයන වර්ධනය සඳහා කාර්මික අංශයෙන් විශාලතම දායකත්වයක් ලැබුණු අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, දියමන්ති හා ස්වර්ණාභරණ සහ රෙදිපිළි හා ඇඟළුම් අපනයන මේ සඳහා මූලික වශයෙන් හේතු විය. 2011 ජූලි මාසයේ දී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 85 දක්වා සියයට 88.6 කින් වර්ධනය විය. මෙයට මගී නැව්, පරිණාමක, ස්ථාවර පරිවර්ථක, ප්‍රේරක සහ පරිවරණීය රැහැන් ආදිය ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 45 ක් දක්වා සියයට 87.5 කින් වර්ධනය වූ අතර මෙතෙක් පැවැති ඉහළතම මාසික අගය වාර්තා කරමින් රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 385 ක් දක්වා සියයට 5.0 කින් වර්ධනය විය. 2011 ජූලි මාසයේ අපනයන ආදායමෙන් සියයට 21.5 කට දායකත්වය ලබාදුන් කෘෂිකාර්මික අපනයන, එ.ජ.ඩොලර් මිලියන 205 දක්වා සියයට 3.6 කින් පහත වැටුණු අතර, තේ අපනයන ආදායම සහ පරිමාව පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රබර් අපනයන ආදායම සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, සුළු කෘෂිකාර්මික බෝග අපනයනයන්හි පැවැති ඉහළ මිල ගණන් එම කාණ්ඩයේ අපනයන ආදායම ඉහළයාම සඳහා හේතු විය.


ඉහළ දේශීය ඉල්ලුම හේතුවෙන් 2011 ජූලි මාසයේ දී සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්ගේ වර්ධනයක් දක්නට ලැබුණි. සමස්ත ආනයන වර්ධනය සඳහා ඉහළ දායකත්වයක් අන්තර් භාණ්ඩ ආනයනවලින් ද (සියයට 56.1 ක) අනතුරුව ආයෝජන භාණ්ඩවලින් ද (සියයට 25.5 ක) ලැබුණි. 2011 ජූලි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයනය එ.ජ.ඩොලර් මිලියන 999 ක් දක්වා සියයට 58.0 කින් වර්ධනය වූ අතර, ඛනිජ තෙල් සහ පොහොර ආනයනයන් සැලකිය යුතු ලෙස වර්ධනය වීම මෙයට හේතු විය. 2010 ජූලි මාසයේ එ.ජ.ඩොලර් 73.53 ක් ලෙස පැවැති ආනයනික බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල සමග සැසඳීමේදී 2011 ජූලි මාසයේ දී බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 112.85 ක් දක්වා වර්ධනය විය. 2011 ජූලි මාසයේ දී ඉහළ ආනයන පරිමාව සහ ඉහළ මිල ගණන් හේතුවෙන් පොහොර සඳහා ආනයන වියදම එ.ජ.ඩොලර් 54 ක් දක්වා වර්ධනය විය. ආයෝජන භාණ්ඩ ආනයනය එ.ජ.ඩොලර් මිලියන 384 ක් දක්වා සියයට 62.1 කින් වර්ධනය වූ අතර මේ සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (එ.ජ.ඩොලර් මිලියන 178) සහ ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි (එ.ජ.ඩොලර් මිලියන 105) ආනයන වියදම ඉහළයාම හේතු විය. 2011 ජූලි මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 39.1 කින් වර්ධනය වූ


අතර, විශේෂයෙන්ම මෝටර් රථ (එ.ජ.ඩොලර් මිලියන 87) වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ මේ සඳහා හේතු විය. තවද 2011 ජූලි මාසයේ දී තිරිඟු ආනයනයන්හි ඉහළ ආයකත්වයක් පිළිබිඹු කරමින් ආහාර හා පාන ආනයන වියදම සියයට 22.9 කින් වර්ධනය විය.

2011 ජූලි මාසයේ දී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2010 වසරේ ජූලි මාසය සමඟ සසඳන විට එ.ජ.ඩොලර් මිලියන 415 ක් දක්වා සියයට 21.1 කින් වර්ධනය වූ අතර, පළමු මාස හත තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලෙස එ.ජ.ඩොලර් මිලියන 2,922 ක් වාර්තා විය. සංචාරක ඉපැයීම් වසරේ පළමු මාස හත තුළ දී එ.ජ.ඩොලර් මිලියන 451 ක් දක්වා සියයට 50 ක ඉහළ අනුපාතයකින් වර්ධනය වූ අතර, එම කාලපරිච්ඡේදය තුළ දී රජයට ලැබුණු විදේශ ලැබීම් (එ.ජ.ඩොලර් බිලියන 1 ක ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් ඇතුළත්ව) ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 2,754 ක් විය. තවද, 2011 වසරේ පළමු භාගය තුළ දී විදේශ සෘජු ආයෝජන (FDI) වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 413 ක් විය.

තාවකාලික ගණනය කිරීම්වලට අනුව, 2011 ජූලි මාසය අවසන් වන විට ආසියානු නිෂ්කාශණ සංගමයේ (ACU) ශේෂය රහිතව දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.1 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. පසුගිය මාස 12 තුළ පැවැති සාමාන්‍ය මාසික ආනයන වියදම වන එ.ජ.ඩොලර් මිලියන 1,421 ට අනුව බලන විට, ආසියානු නිෂ්කාශණ සංගමයේ (ACU) ශේෂය රහිත දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.7 කට සමාන වේ.

මෙම කාලපරිච්ඡේදය තුළදී විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.



# විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය

| | 2010 ජූලි (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ජූලි (ආ) එ.ජ.ඩො. මිලියන | ජූලි වර්ධනය (සියයට) | 2010 ජන: සිට ජූලි (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ජන: සිට ජූලි (ආ) එ.ජ.ඩො. මිලියන | ජන: සිට ජූලි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **875.6** | **957.6** | **9.4** | **4,617.2** | **6,014.4** | **30.3** |
| කෘෂිකාර්මික | 213.1 | 205.4 | -3.6 | 1,172.3 | 1,333.9 | 13.8 |
| මෙයින්: තේ | 153.2 | 127.7 | -16.7 | 802.4 | 832.3 | 3.7 |
| කාර්මික | 655.7 | 743.5 | 13.4 | 3,390.4 | 4,607.0 | 35.9 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 367.1 | 385.4 | 5.0 | 1,866.4 | 2,405.0 | 28.9 |
| රබර් නිෂ්පාදිත | 62.9 | 80.7 | 28.4 | 283.9 | 492.2 | 73.4 |
| ආහාර පාන හා දුම්කොළ | 55.4 | 52.1 | -6.0 | 314.9 | 340.3 | 8.1 |
| ඛනිජ ද්‍රව්‍ය | 6.8 | 8.7 | 28.6 | 54.5 | 73.4 | 34.7 |
| **ආනයන** | **1,123.5** | **1,777.0** | **58.2** | **7,477.2** | **11,091.2** | **48.3** |
| පාරිභෝගික භාණ්ඩ | 245.2 | 341.0 | 39.1 | 1,583.7 | 2,432.2 | 53.6 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 131.9 | 162.1 | 22.9 | 1,019.4 | 1,285.2 | 26.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 113.3 | 179.0 | 57.9 | 564.3 | 1,147.0 | 103.3 |
| අන්තර් භාණ්ඩ | 632.5 | 999.3 | 58.0 | 4,200.9 | 6,177.2 | 47.1 |
| මෙයින්: ඛනිජ තෙල් | 187.5 | 441.9 | 135.7 | 1,788.4 | 2,492.6 | 39.4 |
| රෙදිපිළි හා ඇඟළුම් | 161.4 | 176.4 | 9.3 | 902.5 | 1,290.6 | 43.0 |
| ආයෝජන භාණ්ඩ | 236.7 | 383.8 | 62.1 | 1,553.4 | 2,399.0 | 54.4 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 99.1 | 178.2 | 79.9 | 618.1 | 1,085.9 | 75.7 |
| ප්‍රවාහන උපකරණ | 50.0 | 53.5 | 6.9 | 318.0 | 475.5 | 49.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 62.4 | 104.7 | 67.7 | 451.2 | 589.6 | 30.7 |
| **වෙළෙඳ ශේෂය** | **-248.0** | **-819.5** | **230.4** | **-2,860.0** | **-5,076.8** | **77.5** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **343.0** | **415.4** | **21.1** | **2,326.0** | **2,922.0** | **25.6** |
| **විදේශ සෘජු ආයෝජන (FDI) (ඇ)** | **-** | **-** | **-** | **208.0** | **413.0** | **98.6** |
| **සංචාරක ලැබීම්** | **55.7** | **81.3** | **46.0** | **301.0** | **451.4** | **50.0** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ)** | **279.6** | **1,282.4** | **358.7** | **1,597.0** | **2,754.0** | **72.4** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) විදේශ සෘජු ආයෝජන 2010 හා 2011 ප්‍රථම භාගය සඳහා
(ඈ) 2011 ජූලි මාසයේ රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැදුම්කර නිකුතුවේ ලැබීම් ඇතුළත් වේ.

## 5. 2011 ජූලි මාසයේ දී ගෙවුම් තුලනය ඉහළ අතිරික්තයක් වාර්තා කළේය.

*සියලු විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් හා ගෙවීම් ඇතුළත් ගෙවුම් තුලනය 2011 ජූලි මස අග වන විට එ.ජ.ඩොලර් මිලියන 1,006 ක අතිරික්තයක් වාර්තා කළේය. 2010 වසර අවසානයේ එ.ජ.ඩොලර් මිලියන 6,610 ක්ව පැවති ආසියානු නිෂ්කාෂණ සංගමයේ ලැබීම් හැර දළ නිල සංචිත 2011 ජූලි මස අග වන විට එ.ජ.ඩොලර් මිලියන 8,099 දක්වා ඉහළ ගියේය.*

වර්ධනය වූ සාර්ව ආර්ථික වාතාවරණය සහ විදේශ මූල්‍ය ප්‍රවාහ ආකර්ෂණය කරගැනීම සඳහා ක්‍රියාවට නැංවූ ඇතැම් පියවරයන්, රටෙහි විදේශ සංචිත මට්ටම ශක්තිමත් කිරීමට දායක විය. 2011 ජූලි මස අග වන විට මුළු විදේශ සංචිත (ආසියානු නිෂ්කාෂණ සංගමයේ ලැබීම් හැර) එ.ජ.ඩොලර් මිලියන 9,487 ක් දක්වා වර්ධනය විය. එය ආනයනික මාසවලින් ගත් කළ 2011 ජූලි මස අග වන විට දළ නිල සංචිත සහ මුළු විදේශ සංචිත පිළිවෙළින් මාස 5.7 ක් සහ මාස 6.7 ක් විය. 2011 පළමු මාස 7 තුළ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 6,014 දක්වා සියයට 30.3 කින් ඉහළ ගිය අතර ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 11,091 ක් දක්වා සියයට 48.3 කින් වර්ධනය විය. අනාගත වර්ධනය සඳහා සතුටුදායක පදනමක් සපයමින් යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය වැනි අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය ඉහළයාම හේතුකොට ගෙන ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2010 වසරේ පළමු මාස 7 තුළ දී පැවති එ.ජ.ඩොලර් 79.03 සිට 2011 වසරේ දී එ.ජ.ඩොලර් 107.95 දක්වා සියයට 36.6 කින් ඉහළ ගියේය. බොරතෙල් මිල මෙලෙස ඉහළ යාමෙහි ප්‍රතිඵලයක් ලෙස 2011 වසරේ පළමු මාස 7 තුළ ඛනිජතෙල් මිල එ.ජ.ඩොලර් මිලියන 2,493 ක් දක්වා සියයට 39.4 කින් වර්ධනය විය.

සංචාරක අංශයේ යහපත් වර්ධනය හේතුවෙන් 2011 වසරේ පළමු මාස 7 තුළ දී සේවා ගිණුමෙහි අතිරික්තය එ.ජ.ඩොලර් මිලියන 461 දක්වා ඉහළ ගිය අතර විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 2,922 ක් ලෙස වාර්තා විය. වෙළෙඳ ගිණුමේ හිඟය පුළුල් වුවද, සේවා ගිණුමේ ලැබීම් ප්‍රවාහ සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මගින් වෙළෙඳ ගිණුමේ හිඟයෙන් 2/3 ක් පියවීමට දායක විය. මේ අතර පළමු මාස 7 තුළ රජයේ මුළු විදේශීය ලැබීම් (වසර 10 ක පරිණත කාලයක් සහිත එ.ජ.ඩොලර් මිලියන 1 ක් වූ ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් ඇතුළත්)එ.ජ.ඩොලර් මිලියන 2,754 ක් ලෙස වාර්තා වීම සහ 2011 ප්‍රථම භාගයේ විදේශීය සෘජු ආයෝජන එ.ජ.ඩොලර් බිලියන 413 ක අගයක් වාර්තා කිරීම හේතුවෙන් ගෙවුම් තුලනයේ සමස්ථ ශේෂය 2011 ජූලි මස අග වන විට එ.ජ.ඩොලර් මිලියන 1,006 ක හිතකර අතිරික්තයක් වාර්තා කළේය.

මේ අතර, 2010 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලැබූ මූල්‍ය පාලන ලිහිල්කිරීම් තුළින් විදේශ මුදල් ගනුදෙනු සහ ව්‍යාපාර කටයුතු සඳහා පහසුකම් සලසන ලදී. ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික ආයතනවල විදේශ මූලයන්ගෙන් ණය ලබාගැනීමට පහසුකම් සැලසීම හේතුවෙන් 2011 සැප්තැම්බර් මස මැද වන විට පෞද්ගලික ආයතන 14 න් එ.ජ.ඩොලර් මිලියන 197.1 ක් දක්වා විදේශ ණය ලබාගන්නා ලදී. විදේශ සමාගම්වලට ලංකාව තුළ ව්‍යාපාර කටයුතු සිදුකිරීමට අවසර ලබාදීමත් සමග මෙම වසර තුළ නව විදේශ සමාගම් 20 ක් ශ්‍රී ලංකාව තුළ නව ව්‍යාපාර අරඹන ලදී.

**විදේශීය අංශයේ දර්ශකයන් 2011**

එ.ජ.ඩොලර් මිලියන

| අයිතමය | ජනවාරි - ජූලි | |
|---|---|---|
| | 2010 | 2011 (අ) |
| වෙළෙඳ ශේෂය | -2,860 | -5,077 |
| සංචාරක ඉපැයීම් | 301 | 451 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 2,326 | 2,922 |
| ජංගම ගිණුමේ ශේෂය | -785 | -1,940 |
| රජයේ ලැබීම් ප්‍රවාහ<br>විදේශීය සෘජු ආයේජන | 1,597<br>208 | 2,754<br>413 |
| සමස්ත ශේෂය | 1 | 1,006 |
| | ජූලි මස අවසානයේ දී | |
| | 2010 | 2011 (අ) |
| දළ නිල සංචිත (ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් රහිත) | 5,467 | 8,099 |
| ආනයනික මාස | 5.4 | 5.7 |
| මුළු විදේශීය සංචිත (ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් රහිතව) | 6,913 | 9,487 |
| ආනයනික මාස | 6.8 | 6.7 |

(අ) තාවකාලික

(ආ) විදේශීය සෘජු ආයෝජන 2010 සහ 2011 ප්‍රථම භාගයේ දත්ත මත පදනම් වේ.

## 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2010 සහ 2011

(2006/07= 100)

| මාසය | දර්ශකය | | මාසික වෙනස්වීම % | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 |
| ජනවාරි | 140.4 | 149.2 | 1.9 | 1.4 | 7.1 | 6.2 | 3.2 | 6.1 |
| පෙබරවාරි | 141.1 | 151.3 | 0.5 | 1.4 | 7.5 | 7.2 | 3.3 | 6.1 |
| මාර්තු | 139.8 | 150.6 | -0.9 | -0.5 | 7.2 | 7.7 | 3.4 | 6.2 |
| අප්‍රේල් | 138.4 | 150.6 | -1.0 | 0.1 | 6.8 | 8.9 | 3.8 | 6.4 |
| මැයි | 140.1 | 151.5 | 1.2 | 0.6 | 5.6 | 8.2 | 3.9 | 6.6 |
| ජුනි | 141.2 | 151.2 | 0.8 | -0.2 | 5.1 | 7.1 | 4.3 | 6.7 |
| ජූලි | 141.2 | 151.7 | 0.0 | 04 | 4.4 | 7.5 | 4.6 | 7.0 |
| අගෝස්තු | 141.4 | 151.3 | 0.2 | -0.3 | 5.0 | 7.0 | 4.9 | 7.1 |
| සැප්තැම්බර් | 142.6 | 151.7 | 0.8 | 0.3 | 5.7 | 6.4 | 5.3 | 7.2 |
| ඔක්තෝබර් | 144.1 | | 1.1 | | 6.5 | | 5.7 | |
| නොවැම්බර් | 145.7 | | 1.1 | | 6.9 | | 6.1 | |
| දෙසැම්බර් | 147.2 | | 1.1 | | 6.8 | | 6.2 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව